# සුද්දන්ට එරෙහිව තනිව සටන් කළ සිංහල විරුවන් ගැන තොරතුරු බිඳක්



දහනවවන සියවස (1800 සිට 1900) එළඹෙන විට ලංකාවේ මුහුදුබඩ පාලනය කළේ ඉංග්‍රීසීහුය. ඒ වනවිට ලංකාව තුළ ඉතිරිව තිබූ එකම ස්වාධීන රාජ්‍යය වූයේ උඩරටය. අවස්ථාවක් ලද විගස උඩරටට පහරදී එයද තම කිරුළට ඈඳා ගැනීම බ්‍රිතාන්‍යයන්ගේ ඒකායන අරමුණ විය.

ෆෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයාගේ මඟපෙන්වීම මත, 1803 කර්නල් බේලිගේ ප්‍රධානත්වයෙන් යුත් හමුදාවක් උඩරට ආක්‍රමණය කළහ. ඉංග්‍රීසි සේනාවක් උඩරටට පහරදීමට එන බව ඇසූ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා පළමුව ඔවුන් හා යුද්ධ කළ හැකිදැයි සොයා බැලුවේය. නායක්කර් වංශික ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියාකලාපය ගැන ඒ වන විට උඩරට ජනතාව පමණක් නොව බොහෝ ප්‍රධානීහු ද කලකිරී සිටියහ. හමුදා භාරව සිටි ඇතැම් ප්‍රධානීහු තම හමුදා විසුරුවා හැර තිබුණහ. මෙම තත්වයන් නිසා, ඉංග්‍රීසීන්ට මුහුණදිය නොහැකි බව ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමන්ට අවබෝධ වන්නට ඇත. රජතුමා බිසෝවරුද, වස්තුවද රැගෙන හිතවත් නිලමේවරු පිරිසක් ද සමග හඟුරන්කෙතට පළා ගියේය.

බේලිගේ සේනාව බරපතල සටනකින් තොරව මහනුවරට පැමිණියහ. මහනුවර වැනසූ ඔවුන්ගේ එකම බලාපොරොත්තුව වූයේ කෙසේ හෝ රජු අල්ලා ගැනීමය. ඒ අනුව ඔවුහු හඟුරන්කෙත බලා පිටත් වූහ.

හඟුරන්කෙත ගමන ඉංග්‍රීසීන් සිතූ තරම් ලෙහෙසි වූයේ නැත. කඳුමුදුන්වල, වනාන්තරවල සැඟවී සිටි සිංහලයෝ, විවිධ අන්දමින් ප්‍රහාර එල්ල කළහ. කාලතුවක්කු, තුවක්කු, දුනු හී ආදියෙන් ප්‍රහාර එල්ල කිරීම පමණක් නොව, ගල් පෙරලීම, විශාල ගස් කපා හෙළීම වැනි සටන් ක්‍රමද සිංහලයෝ ප්‍රයෝජනයට ගනු ලැබූහ.

දෙල්තොට හරහා කොටකේපිටිය ඔස්සේ ඉංග්‍රීසීහු ගම්බිම් වනසමින් හඟුරන්කෙත බලා එන ආරංචිය ලැව් ගින්නක් සේ පැතිර ගියේය. මෙය ඇසූ ජනතාව හිස් ලූ ලූ අත පලා ගියහ. සමහරු අතට හසුවන දෑ ගෙන වන වැදුණු අතර තවත් පිරිස් දරුමල්ලන් ද කැටුව ඈත කඳුකරයට රිංගා ගත්හ. ධෛර්ය සම්පන්න ඇතැම් සිංහලයෝ, ඉංග්‍රීසීන් එන මඟ රැඳී සිටිය අතර, ඔවුන්ට එරෙහි හුදකලා සටන්වල ද නිරත වූහ.

ගම්බිම් වනසමින් ඉංග්‍රීසීන් ඉදිරියට එන පුවත උනැන්තැන්න ගමේ පදිංචිව සිටි වීසිංගෙදර කුඩාරාල නම්වූ තරුණයාට ද දැනගන්නට ලැබිණ. දේශප්‍රේමී සිංහලයෙකු වූ ඔහු සෙස්සන් පලා යද්දී හෙල්ලක් ද රැගෙන පෙරමුණට ගියේය.

මහනුවර සිට හඟුරන්කෙත බලා වැටී තිබූ මාවතේ එක් තැනකදී මා ඔයෙන් එතෙර විය යුතුව තිබිණ. එම ස්ථානයේදී ඔය ඉතා පටුවූ අතර ගල්කුළුවලින් ද ගහණ විය. ජල පහරද වේගවත් විය. මෙතනදී ඔය හරහා එතෙර විය යුතු වූයේ මෙහා ඉවුරේ පිහිටි ගල් කුලක් මත සිට එහා ඉවුරේ පිහිටි ගල් කුලත් මතට පැනීමෙනි. එහෙයින්ම මෙම ස්ථානය පනිනාගල නම් විය.

පනිනාගලෙහි වූ ගල්කුළු දෙකම ඉවුරේ සිට ගඟ මැදට නෙරා තිබූ අතර එකක් යට කුඩා ගල් තැල්ලක් විය. ගල මතුපිටට අඩි හයක් පමණ යටින් පිහිටි මෙම ගල්තැල්ල වර්ග අඩි තුන හතරක් පමණ විශාල විය.

ඉංග්‍රීසි සේනාව හඟුරන්කෙතට යා යුත්තේ පනිනාගල හරහා බව කුඩාරාල දැන සිටියේය. ඔහුට සතුරාට එරෙහි විය හැකි හොඳ උපායක් කල්පනා විය. හෙල්ල ද රැගෙන වහ වහා පනිනාගල කරා ගිය කුඩාරාල මහත් අසීරුවෙන් ගල්තැල්ල මතට ගොඩ විය. ගල්තැල්ල මත නැගී සිටි ඔහු එක් අතකින් පසෙක වූ කුඩා ගල් පතුරක් අල්ලාගෙන අනෙක් අතට හෙල්ල වාරු කොට ගත්තේය.

කුඩාරාල මෙසේ රැඳී සිටියා යැයි කියන පනිනාගලත් එහි වූ ගල්තැල්ලත් අද ද දැකිය හැකිය. උනන්තැන්න ගම ආශ්‍රිතව පිහිටි එම ස්ථාන දකින විට ඔහුගේ මෙම ක්‍රියාවේ අසීරුතාවය මොනවට පැහැදිලි වේ.

**සිංහලේ ඉතිහාසයේ විරුවන් බහුලය. අධිරාජ්‍යවාදීන්ගේ යකඩ සපත්තුවලට එරෙහිව නැගී සිටි ඔවුහු, පෙරදිග දී බටහිර ජාතීන්ට අමතක නොවන පාඩම් ඉගැන්වූහ. දන්තුරේ, ගන්නෝරුව, වැල්ලවාය ආදී ප්‍රදේශවල දී පෘතුගීසි සේනා සමූල ඝාතනය කෙරිණ. මේ සටන්වල දී පෘතුගීසි සෙන්පතීහු පවා මළහ. ලන්දේසි, ඉංග්‍රීසීහු ද සිංහලයන්ගෙ රණකාමීත්වය හමුවේ පරාජය වූ අවස්ථා බොහෝය. සිංහලයන් තුළ වූ අසමගිකම් නිසාම ඔවුන් බටහිර ජාතීන්ට යටත් වූවා යැයි කීවොත් නිවැරදිය. ඔවුන් එදා බටහිර අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව එකමුතුව, සමගිව සටන් වැදුණා නම්, නිදහස් රටක් ජාතියක් ලෙස දිගටම වැජඹෙන්නට ඉඩ තිබිණ.**

ටික වේලාවක් ගත විය. ඉංග්‍රීසි සේනාවේ හටයෝ එකා පසුපස එකාවිත් පනිනාගලෙන් එතෙර වන්නට වූහ. එක්වරම, එසේ පනිමින් සිටි සෙබළෙක් අදහාගත නොහැකි අන්දමට ඔයට ඇද වැටුණේය. වඩාත් විමසිල්ලෙන් එතෙර වූ ඊළඟ සෙබළා ද එසේම ඇද වැටිණ. සිදුවන්නේ කුමක්දැයි වටහාගත නොහැකි වූ සෙබළු හොඳින් විපරම් කර බලා එගොඩට පැන්නද තවත් දෙදෙනෙකුට ම අත්වූයේ පෙර ඉරණමමය.

සිදුවූයේ කුමක්ද? ගල්තැල්ල මතට වී කුඩා ගල් පතුරක් අල්ලාගෙන සිටි කුඩාරාල තමන් අතවූ හෙල්ලෙන් එගොඩට පනිනා සෙබළුන්ට ඇන්නේය. ක්ෂණිකව සිදුවන මෙම ක්‍රියාවලිය කිසිදු ඉංග්‍රීසි සෙබළෙකුගේ ඇස නොගැටුණු අතර, ගල්කුල යට ගල්තැල්ලක මිනිසෙක් සිටිනවා යැයි කිසිවකු සිතන්නටද නැත.

මේ අතර හදිසියේම මාඔයේ ජල මට්ටම වැඩි විය. එය කුඩාරාල රැඳී සිටි ගල්තැල්ල මතින් වේගයෙන් ගලායන තරමට ම වැඩිවිය. සෑහෙන වේලාවක් හෙල්ලක් ද රැගෙන වවුලෙකු මෙන් එල්ලී හුදකලා සටනක නිරත වූ කුඩාරාළගේ ශරීර ශක්තිය ද වේගයෙන් හීන වන්නට විය. තවත් මොහොතක දී ඔහු ජල පහරට ඇද වැටිණ. එසේ අවාසනාවන්ත මරණයකට ගොදුරු වුවද කුඩාරාල ඒ වන විට හුදකලා සටනක් කොට ඉංග්‍රීසි සොල්දාදුවන් සිව්දෙනෙකුගේ දිවි තොර කර තිබිණ.

සිංහලේ ඉතිහාසයේ විරුවන් බහුලය. අධිරාජ්‍යවාදීන්ගේ යකඩ සපත්තුවලට එරෙහිව නැගී සිටි ඔවුහු, පෙරදිග දී බටහිර ජාතීන්ට අමතක නොවන පාඩම් ඉගැන්වූහ. දන්තුරේ, ගන්නෝරුව, වැල්ලවාය ආදී ප්‍රදේශවල දී පෘතු ගීසි සේනා සමූල ඝාතනය කෙරිණ. මේ සටන්වල දී පෘතුගීසි සෙන්පතීහු පවා මළහ. ලන්දේසි, ඉංග්‍රීසීහු ද සිංහලයන්ගෙ රණකාමීත්වය හමුවේ පරාජය වූ අවස්ථා බොහෝය. සිංහලයන් තුළ වූ අසමගිකම් නිසාම ඔවුන් බටහිර ජාතීන්ට යටත් වූවා යැයි කීවොත් නිවැරදිය. ඔවුන් එදා බටහිර අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව එකමුතුව, සමගිව සටන් වැදුණා නම්, නිදහස් රටක් ජාතියක් ලෙස දිගටම වැජඹෙන්නට ඉඩ තිබිණ.

විරුවන්ගෙන් බහුල සිංහල ඉතිහාසය තුළ පෙර කී කුඩාරාල වැනි වූ අප්‍රකට විරුවෝ ද බහුලය. එහෙත් අවාසනාවකට ඔවුන් පිළිබඳව ලිඛිත සටහන් දුර්ලභය. ලිඛිත සටහන් ඇත්තේ කැප්පෙටිපොල, මඩුගල්ලේ, පුරන්අප්පු ආදී වශයෙන් ප්‍රසිද්ධියට පත් විරුවන් ගැන පමණි. ඔවුන් හා සමතැනෙහිලා ගිණිය හැකි කුඩාරාල වැනි විරුවන් ගැන දැනගන්නට ලැබෙන්නේ ජනශ්‍රැති හා ජනප්‍රවාදවලිනි. එසේ කරුණු හෙළිදරව් වන තවත් විරුවකු වන්නේ හඟුරන්කෙත කිරිඅප්පුය.

19 වන සියවස එළඹෙන විට උඩරට ප්‍රධානීහු රැසක්, රජුට එරෙහිව ඉංග්‍රීසීන්ගෙ පැත්ත ගෙන සිටියහ. රජු ගැන කලකිරී සිටි ඇතැම් ප්‍රභූහු රජුගෙන් මෙන්ම ඉංග්‍රීසීන්ගෙන් ද දුරස්ව සිටියහ. මේ තත්වයේ ප්‍රතිඵලයක් ලෙස උඩරට ප්‍රධානීන් යටතේ වූ සිංහලේ හමුදා කොටස් ද විසුරුවා හැර තිබිණ. මේ විසුරුවා හරින ලද සිංහලේ හමුදා බලඇණිවල සේවය කළ කිරිඅප්පු නම් තැනැත්තෙක් හඟුරන්කෙතට නුදුරු බෝගහමඩිත්ත නම් ගමේ විසීය.

1815 දී උඩරට අල්ලාගත්ත ද ඉංග්‍රීසීන්ට එක්වර ම ශ්‍රී වික්‍රම රාජසිංහ රජු අල්ලා ගැනීමට හැකිවූයේ නැත. රජු මැද මහනුවර ප්‍රදේශයේ සිටින බවට ලද හෝඩුවාවක් අනුව ඉංග්‍රීසි සේනාවක් ගඟ පළාත කෝරලයේ මැදින් මැද මහනුවර බලා ගියහ. ගඟ පළාත කෝරලය හා දියතිලක කෝරලය වෙන්වන සීමාවේ වල්ජම්මුගහමුල නම් ප්‍රදේශයක් වෙයි. මේ ප්‍රදේශය හරහා ඉංග්‍රීසි සේනාවක් ගමන් කරන බව සිංහලේ යුද සේනාවෙන් බැහැර වී සිටි කිරිඅප්පුට දැනගන්නට ලැබිණ. ඔහුට ඉවසුම් නැතිවිය.

තුවක්කුව අතින් ගෙන කිරිඅප්පු වල්ජම්බුගහමුල ප්‍රදේශයේ මාර්ගය අසල වූ දැවැන්ත ගසක පිහිටි සිදුරකට රිංගා ගත්තේය. රුක් සිදුරට වී, තුවක්කුවට බෙහෙත් දමා කොටා සූදානම් කරගෙන හෙතෙම ඉංග්‍රීසි සේනාවට එරෙහි හුදකලා සටනක නියැලෙන්නට තීරණ කළේය.

කිසිවක් නොදත් ඉංග්‍රීසි හටයෝ, රුක් සිදුර ඉදිරියෙන් ගමන් කරන්නට වූහ. රුක් සිදුරේ සිටි කිරිඅප්පු ඉලක්කය අල්ලා තැබූ වෙඩි පහරින්, ඉංග්‍රීසි සොල්දාදුවෙකු එතනම මැරී වැටුණේය. සෙස්සෝ බොහෝ කළබල වූහ. වෙඩිල්ල ආවේ කොතනින්දැයි සොයා ගැනීමට සැවොම වෙහෙසුණද කිසිවකුටත් ඒ ගැන සිතාගැනීමටවත් නොහැකි විය. මොහොතකින් යළිත් වෙඩි හඬක් නැගිණ. තවත් ඉංග්‍රීසි සොල්දාදුවෙක් මැරී වැටී සිටියේය. සිංහල සේනාවක් තමන් වටකොට ඇතැයි ඉංග්‍රීසීහු සිතූහ. එහෙත් ඒ වන විට සිංහල සේනාව බිඳී විසිර ගොස් සිටියෝය.

මේ අතර ඉංග්‍රීසි සොල්දාදුවන් අතර සිටි ජා හටයෙකුට අසල වූ රුක් සිදුරු තුළ කිසිවකු සිටින බව පෙනිණ. වෙඩි පහර එල්ල කෙරෙන්නේ එතැනින් බව ඔහු ක්ෂණිකව වටහා ගත්තේය. වහා ක්‍රියාත්මක වූ ජා හටයා, රුක් සිදුර තුළට වෙඩි තැබීය. කිරි අප්පුගේ හුදකලා වික්‍රමය එතැනින් නිමාවිය.

හුදකලා සටන්වල නියැලෙමින් සතුරන්ට එරෙහිව කටයුතු කළ තවත් සිංහලයන් පිළිබඳ කතා රැසක් ජනශ්‍රැති හා ජනප්‍රවාද හාරා අවුස්සද්දී එළියට එයි. මේ හැමකින්ම පිළිඹිබුවන්නේ එක් දෙයකි. එනම් එදා සිංහලයා තුළ වූ දේශහිතෛෂී බවයි. තම ජීවිතය පරදුවට තබා හුදකලාව හෝ සටන් කළ මෙවන් විරුවන් බඳු දේශහිතෛෂීන් අද ද අප රටට අවශ්‍යව තිබේ.

පැතුම් ගජනායක

**සිතුවම් උපුටා ගැනීම**
මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද ශූරීන්ගේ
උඩරට මහ කැරැල්ල 2 කෘතියෙනි

